චක්‍රලේඛ අංක: 94/11

මගේ අංකය: එල්2/5/42
කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය,
493, ටී.බී.ජයා මාවත,
කොළඹ 10.
1994 දෙසැම්බර් මස 19 වැනිදා.

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත.

## දීර්ඝ කාලීනව රජයේ ඉඩම් බදුදීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නිර්දේශ ඉදිරිපත් කිරීම.

දීර්ඝ කාලීනව බදුකර නිකුත් කිරීම සඳහා සහ දීමනාපත්‍ර නිකුත් කිරීම සඳහා පදනම වන්නේ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඒ සඳහා කෙරෙන නිර්දේශ යයි.

එවැනි බදුදීම සඳහා තීරණ ගැනීමට ප්‍රමාණවත් තරම් වන අයුරු ඉඩම් සංවර්ධනය පිළිබඳ වාර්තා බොහෝවිට අමාත්‍යාංශය වෙත නොලැබේ. එවැනි වාර්තා නොමැති විටදී බදුකර නිකුත් කල යුතුද, නැද්ද යන්න තීරණය කිරීම අපහසු වන අවස්ථා බොහෝ අවස්ථාවන්හිදී පැන නැගී ඇත.

සමහර අවස්ථාවල විශාල බිම් ප්‍රමාණ බදුදීම සඳහා නිර්දේශ ලැබී ඇත්තේ ඉඩමේ සංවර්ධනය පිළිබඳ අවශ්‍ය මූලික විස්තරවත් නොමැතිවයි.

(2) මෙවැනි ඌනතා මගහැර වීමට පිළියමක් වශයෙන්, ඉඩම් බදුදීම සඳහා සිය නිර්දේශයන් ඉදිරිපත් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් විසින් යොදා ගතයුතු වාර්තා ආකෘතියක් මීට අමුණා ඇත. මින් ඉදිරියට එම ආකෘතිය අනුව වාර්තා සකස් කල යුතු වේ. අසා ඇති විස්තර ඉඩමට අදාල නොවේ නම්, ඒ බව සඳහන් කළ යුතු ය. එවැනි තැන් හිස්ව තැබීමෙන් වාර්තාව අසම්පූර්ණ ලෙස සලකා එය ඔබ වෙත නැවත යොමු කිරීමට සිදුවිය හැක.

ඉඩම් ප්‍රමාණයේ සීමිත බව සහ ඒ සඳහා ඇති දැඩි ඉල්ලුම සලකා, බදු සඳහා නිර්දේශ කළ යුත්තේ ඉඩම නිසි පරිදි පරීක්ෂා කොට, සංවර්ධනය කර ඇති බිම් ප්‍රමාණය පමණි.

02......./

(3) - ප්‍රමාණයෙන් අක්කර එකට වැඩි ඉඩම් ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් පුද්ගලිකව පරීක්ෂා කොට, මෙම ආකෘති පත්‍රය අනුව වාර්තාව සකසා සහතික කොට, පළාත් ඉඩම් කොමසාරිස් මඟින් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු ය.

ටී.එච්.කරුණාතිලක,
අතිරේක ලේකම්,
කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් ලේකම් වෙනුවට

පිටපත්:- (1) ඉඩම් කොමසාරිස්
(2) පළාත් ඉඩම් කොමසාරිස්වරුන් (සියලු ආකෘති පිටපත් අමුණා ඇත)

} මින් ඉදිරියට මෙම උපදෙස් හා ආකෘති අනුව, සකස් කල නිර්දේශ මගින් පමණක් අවශ්‍ය කටයුතු කරන්න.

එස්/20